NAPLAN NATIONAL ASSESSMENT PROGRAM Literacy and Numeracy

Sinhalese

# දෙමාපියන් සහ රැකවරණය සපයන්නන් සඳහා තොරතුරු 2017

## (NAPLAN) ජාතික ඇගයුම් වැඩසටහන - සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාව යනු කුමක්ද?

ජාතික ඇගයුම් වැඩසටහන - සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාව (NAPLAN) යනු වසර 3, 5, 7 සහ 9 සියලුම සිසුන් සඳහා ඇති වාර්ෂික ඇගයුමකි. මෙම වසර වල සිටින සියලුම සිසුන් කියවීම, ලිවීම, භාෂා සම්මතයන් (අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුනු) සහ සංඛ්‍යා හැකියාව පිළබඳ පරීක්ෂණවලට සහභාගිවීම අපේක්ෂා කෙරේ. NAPLAN අන්තර්ගතය සංවර්ධනය කිරීම සඳහා සියලුම රජයේ සහ රජයේ නොවන අධ්‍යාපන බලධාරීහු දායකවී ඇත

## සිසුන් NAPLAN පරීක්ෂණ වලට පෙනීසිටින්නේ මන්ද?

NAPLAN යනු යොවුන් ඕස්ට්‍රේලියානුවන් සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාව පිලිබඳ වැදගත් අධ්‍යපනික ප්‍රතිඵල සාධනය කරන්නේද නැත්ද යන්න රජයට, අධ්‍යාපන බලධාරින්ට, පාසැල් වලට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට තහවුරු කරගැනීමට හැකියාව ලබාදෙන මිනුම් දණ්ඩයි. පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී ඒ ඒ ශිෂ්‍යයන් විසින් පෙන්වන කුසලතාවය පිළිබඳ දෙමාපියන්ට සහ පාසැලට මෙම පරීක්ෂණ මගින් අවබෝධයක් ලබා දෙනු ලැබේ. අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය හා වැඩිදියුණු කළ යුත්තේ කුමන විෂයපථයන්ද යන්න ගැන ඔවුන් පාසල් වලට ,ප්‍රාන්ත වලට සහ පලාත් වලට තොරතුරු සපයයි.

NAPLAN පරීක්ෂණ පාසැලක ඇගයුම් සහ වාර්තා ක්‍රියාපටිපාටිය එක් අංගයකි. එම පරීක්ෂණ එක් එක් ශිෂ්‍යයාගේ කුසළතා පිළිබඳව ගුරුවරුන් විසින් සවිස්තරව, අඛණ්ඩව කරනු ලබන ඇගයුම් සඳහා ආදේශනයක් නොවේ.

## පරීක්ෂණය කරනු ලබන්නේ කුමක්ද, කෙසේද?

සෑම ළමයෙකුටම පාසැලේ සහ ජීවිතයේ ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වන කියවීම, ලිවීම, අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ සංඛ්‍යා හැකියාව වැනි හැකියාවන් NAPLAN මගින් පරීක්ෂණය කෙරේ. NAPLAN විෂයපථය ඔස්ට්‍රෙලියානු විෂයමාලාව හා බැඳී ඇත. මේ ගැන වැඩිදුර තොරතුරු සඳහා ණංඑ වෙබ් අඩවිය බලන්න # www.nap.edu.au

මෙම ප්‍රශ්න එක්කෝ බහුවරණ, නැතහොත් කෙටි ලිඛිත පිලිතුරක් අපේක්ෂිත ප්‍රශ්න වේ. ලිවීමේ කාර්යය සඳහා සපයනු ලබන ඉඟියකට සිසුන් විසින් පිළිතුරු පාඨයක් ලිවිය යුතුය.

පරීක්ෂණයේ ස්වභාවය ගැන ඔබට යම් අවබෝධයක් ලබා ගැනීම සඳහා ආදර්ශ ප්‍රශ්න සහ ආදර්ශ ලිවීමේ කාර්යයන් මේ NAP වෙබ් අඩවිය.

## පරීක්ෂණ පවත්වනු ලබන්නේ කවුරුන් විසින්ද?

NAPLAN පරීක්ෂණ පාසැල් විසින් පවත්වනු ලබන අතර, පංති භාර ගුරුවරු, පාසැල් උප ප්‍රධානීන් හෝ විදුහල්පතිවරු විසින් පරිපාලනය කෙරෙනු ලැබේ. නිශ්චිත මෙහෙයුම් නිර්ණායක සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව පරීක්ෂණ ලකුණු කිරීම පිළිබඳ වගකීම එක් එක් ප්‍රාන්තය සහ පලාත සතුවේ.

## මගේ ළමයාට පරීක්ෂණවලට සූදානම් වීමට මට උදව් කල හැක්කේ කෙසේද?

NAPLAN මගින් සිසුන් දැනටමත් පාසල් විෂයමාලාව හරහා ඉගෙන ගන්නා ලද සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියාවන් අගයනු ලැබේ. සිසුන්ට පරීක්ෂණයන්හි ආකෘතිය ගැන හුරුපුරුදු බව ලබා දීමටත්, ඔවුනට නිසි උදව් සහ මගපෙන්වීම් සැපයීමටත් ගුරුවරු සහතික වෙති. NAPLAN සඳහා ඔබේ ළමයාගේ සූදානම ගැන ඔබට යම් ප්‍රශ්න ඇත්නම්, ඔබ ඒ ගැන ඔවුන්ගේ ගුරුවරයා සමග කතා කිරීමට වේලාවක් යොදා ගත යුතුය.

NAPLAN පරීක්ෂණ ඔවුන්ගේ පාසල් වැඩසටහනේ කොටසක් පමණක් බව යලි තහවුරු කිරීමෙන් NAPLAN සඳහා සූදානම් වීමට ළමයාට සහාය වන්න, එමෙන්ම පරීක්ෂණ දින ඔවුනට හැකි පමණ හොඳින් එයට මුහුණදීමට මතක් කරන්න. පුහුණුකරුවන්ගේ සේවය ලබාගැනීම නිර්දේශ නොකෙරේ.

NAPLAN සඳහා ඔබේ දරුවා සූදානම් වීම පිළිබඳ ඔබට යම්කිසි ප්‍රශ්නයක් ඇත්නම් , ඔවුනුගේ ගුරුවරයා සමග කතාකිරීමට වේලාවක් යොදාගන්න.

## විශේෂ අවශ්‍යතාවන් ඇති සිසුන්ට පාසැල් මගින් සපයන අතිරේක උපකාර මොනවාද?

සෑම ශිෂ්‍යයෙකුටම NAPLAN පරීක්ෂණ වලට පෙනීසිටීමට උනන්දු කරවනු ලැබේ. ආබාධතා ඇති සිසුන්ට පන්ති කාමරයේ සාමාන්‍යයෙන් සැපයෙන උපකාර පිළිබිඹු වන විශේෂ විධිවිධාන ලබා ගැනීමට සුදුසුකම් ලබා ගැනීමට පුලුවන. තාවකාලිකව තුවාලවී සිටින සිසුන්ටද සාධාරණ ප්‍රතියෝජන සැලසේ.

දැඩි බුද්ධිමය ආබාධතා සහිත සහ/හෝ දැඩි සමගාමී අනියම් තත්ත්වයන් සහිත, හෝ ඉංග්‍රීසි කතා නොකරන පසුබිමක් සහිත මෑතකදී ඔස්ට්‍රේලියාවට පැමිණි සිසුවෙක්ට මෙම ඇගයුමෙන් විධිමත් නිදහස් කිරීමක් ලබා ගත හැක.

විශේෂ විධිවිධාන හෝ විධිමත් නිදහස් කිරිමක් ලබාගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය ගැන වැඩිදුර විස්තර ඔබට ලබාදීමට ඔබේ ප්‍රාන්තයේ පරීක්ෂණ භාර අධිකාරියට හා ඔබේ පාසැලේ විදුහල්පතිනියට පුළුවන.

VICTORIAN CURRICULUM AND ASSESSMENT AUTHORITY

VICTORIA State Government

## NAPLAN කාර්ය සාධනය මනින්නේ කෙසේද?

NAPLAN යනු සමත් හෝ අසමත් වර්ගයේ පරීක්ෂණයක් නොවේ. එක් එක් පරීක්ෂණයේදී යම් ශිෂ්‍යයෙක් විසින් පෙන්වන ලද කුසළතා ජාතික සාධන පරිමාණයක් මගින් පෙන්නුම් කරනු ලැබේ. සෑම පරීක්ෂණ පරිමාණයකටම තීරු දහයක් තිබෙන අතර සෑම වසර මට්ටමක්ම එකම පරිමාණයකට අනුව වාර්තා කෙරේ.

මෙයින් එක තීරුවක් නියෝජනය කරන්නේ එක් එක් වසර මට්ටම සඳහා ජාතික අවම ප්‍රමිතියයි. ජාතික අවම ප්‍රමිතියක ප්‍රතිඵලයකින් පෙන්වා දෙන්නේ සිසුවා එම වසර මට්ටමේ සහභාගිවීමට අවශ්‍යවන මූලික සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා නිපුණතා පෙන්නුම් කර ඇති බවයි. යම් සිසුවකු දැක්වූ කුසළතාව ඔස්ට්‍රේලියාවේ සියලුම සිසුන්ගේ කුසළතා සාමාන්‍යය සමග සැසඳිය හැක.

## පරීක්ෂණ පවත්වන දිනවල මගේ ළමයා පාසැලට නොපැමිණිය හොත් කුමක් සිදුවේද?

පරීක්ෂණ පවත්වන අවස්ථාවේ පාසැලට නොපැමිණි සිසුන් සඳහා හැකියාවක් ඇත්නම්, පරීක්ෂණ පැවැත්වෙන සතිය තුළදීම වෙන වේලාවක එම මගහැරුනු පරීක්ෂණ නිම කිරීමට පාසැල විසින් කටයුතු සලසනු ඇත. 2017 මැයි 12 වන සිකුරාදා යින් පසු පෞද්ගලික සිසුන්ට මෙම පරීක්ෂණයට පෙනීසිටීමට අවසර නැත.

## මගේ ළමයාගේ කුසළතාවය ගැන වාර්තාවක් මට ලැබේද?

වසර අවසානයේදී NAPLAN වාර්තාවක් පාසැල විසින් ඔබට නිකුත් කරනු ඇත. ඔස්ට්‍රේලියාවේ සෑම සිසුවෙකු සඳහාම භාවිතා කරනුයේ එකම වාර්තා ආකෘතියකි. වාර්තාව නිවසට එවන දිනය පාසැල විසින් ඔබට දන්වනු ඇත. ඔබට වාර්තාවක් නොලැබුනොත් ඔබ ඒ ගැන පාසැල අමතන්න. එක් එක් ශිෂ්‍යයාගේ ප්‍රතිඵල නිශ්චිතවම රහසිගතය.

## NAPLAN පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගන්නේ කිනම් ආකාරයටද?

- ඉගැන්වීම් වැඩ සටහන් වල ශක්තීන් සහ දූර්වලකම් හඳුනා ගැනීමටත්, සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා පිළිබඳ ඉලක්ක සැකසීම සඳහාත් පාසැල් විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- වැඩ සටහන් සහ පාසැල් වලට සපයනු ලබන ආධාර සමාලෝචනය කිරීම පිණිස පාසැල් පද්ධති විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- ගුරුවරු සමග ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා සිසුන්ට සහ දෙමාපියන්ට පුද්ගලික ප්‍රතිඵල උපයෝගී කරගත හැක.
- වැඩිතර අභියෝග හෝ අතිරේක උපකාර අවශ්‍ය සිසුන්ව වඩා හොඳින් හඳුනාගැනීම සඳහා ගුරුවරු විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- පොදු ජනතාවට පාසැල්වල NAPLAN ප්‍රතිඵල සාමාන්‍යය My School වෙබ් අඩවියෙන් බලාගැනීමට පුලුවනඃ www.myschool.edu.au

## මට වැඩිදුර තොරතුරු ලබා ගත හැක්කේ කොතැනින්ද?

NAPLAN ගැන වැඩිදුර තොරතුරු සඳහාඃ

- NAP වෙබ් අඩවියට පිවිසෙන්න www.nap.edu.au
- ඔබේ ළමයාගේ පාසැල අමතන්න
- ඔබගේ ප්‍රාන්තයේ හෝ පළාතේ අධ්‍යාපන අධිකාරිය හා සම්බන්ධ වන්න. (NAP වෙබ් අඩවියේ වැඩිදුර විස්තර අඩංගු වේ).

ACARA රහස්යතා ප්රතිපත්තිය සඳහා, යන්න කරන්න: www.acara.edu.au/contact-us/privacy

## 2017 NAPLAN පරීක්ෂණ කා ලසටහන

| | මැයි 9 වෙනි අඟහරුවාදා | මැයි 10 වෙනි බදාදා | මැයි 11 වෙනි බ්‍රහස්පතින්දා |
|---|---|---|---|
| 3 වසර | **භාෂා සම්මතයන්** මිනිත්තු 40 **ලිවීම** මිනිත්තු 40 | **කියවීම** මිනිත්තු 45 | **සංඛ්‍යා හැකියාව** මිනිත්තු 45 |
| 5 වසර | **භාෂා සම්මතයන්** මිනිත්තු 40 **ලිවීම** මිනිත්තු 40 | **කියවීම** මිනිත්තු 50 | **සංඛ්‍යා හැකියාව** මිනිත්තු 50 |
| 7 වසර | **භාෂා සම්මතයන** මිනිත්තු 45 **ලිවීම** මිනිත්තු 40 | **කියවීම** මිනිත්තු 65 | **සංඛ්‍යා හැකියාව** මිනිත්තු 60 |
| 9 වසර | **භාෂා සම්මතයන** මිනිත්තු 45 **ලිවීම** මිනිත්තු 40 | **කියවීම** මිනිත්තු 65 | **සංඛ්‍යා හැකියාව** මිනිත්තු 60 |

- භාෂා සම්මතයන් පරීක්ෂණයට අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුනු ඇතුලත් වේ.
- සංඛ්‍යා හැකියා පරීක්ෂණයට සංඛ්‍යාෂ වීජ ගණිතය, ශ්‍රිතය මිනුම, රේක ගණිතය, සම්භාවිතාව සහ දත්ත ඇතුළත් වේ.
- 3 වසර සහ 5 වසර සංඛ්‍යා හැකියා පරීක්ෂණයේදී කැල්කියුලේටර පාවිච්චි කිරීමට අවසර නොලැබේ. 7 වසර සහ 9 වසරේ සෑම සිසුවක්ම එක සංඛ්‍යා හැකියා පරීක්ෂණයට **පෙනී සිටිය.** මෙම පරීක්ෂණයේ කොටස් දෙකක් ඇතඃ එක් කොටසකට කැල්කියුලේටර පාවිච්චි කිරීමට අවසර ඇති අතර අනෙක් පරීක්ෂණයට කැල්කියුලේටර පාවිච්චි කිරීමට අවසර නැත.



© Australian Curriculum, Assessment and Reporting Authority 2017

acara AUSTRALIAN CURRICULUM, ASSESSMENT AND REPORTING AUTHORITY